# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 නොවැම්බර්


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2019 නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 4.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය ඔක්තෝම්බර් මාසයේ මතුපිට උද්ධමනය 5.6%ක් ලෙස වාර්තා විය. 2019 නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.8%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.3%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 නොවැම්බර් මාසයේ 1.0% ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -1.8%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.8%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 ඔක්තෝම්බර් මාසයේ 131.9ක් වූ දර්ශකාංකය 2019 නොවැම්බර් මාසයේ 132.9ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 නොවැම්බර් මාසයේ දර්ශකාංකය 1.0ක වැඩිවීමක් එනම් 0.8ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.78% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.001%කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට සහල්, එළවළු, රතුළූණු, පොල්, අර්තාපල්, අමු මිරිස්, මිරිස් කුඩු, කිරිපිටි සහ පොල්තෙල් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් ලොකුළූණු, අළුත් මාළු, කෙසෙල්, පැපොල්, අඹ සහ දෙහි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා විය.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත් සහ පුවක්) සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (එල් පී ගෑස්) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම බලපා ඇත. කෙසේ වෙතත් පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'ප්‍රවාහන' (ගුවන් ගමන් ගාස්තු), ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'විවිධ භාණ්ඩ හා සේවා' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. කෙසේ නමුත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2019 ඔක්තෝම්බර් මාසයේ 5.6% සිට 2019 නොවැම්බර් මාසයේ 5.5% දක්වා අඩුවීමක් වාර්තා විය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2018** | නොවැ. | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 |
| | දෙසැ. | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 |
| **2019** | ජන. | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 |
| | පෙබ. | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 |
| | අගෝ. | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 |
| | සැප්. | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 |
| | ඔක්. | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 |
| | නොවැ. | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 |